| විෂය - චිත්‍ර |
|---|
| **කාර්ය පත්‍රිකාව - 10ශ්‍රේණිය - 2021.ජනවාරි. පස්වන සතිය** |

7.1.3 පාඩම ඇසුරින් -කලච්චේද 01

- ***ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් ඇගයීම.***

***නිපුණතා මට්ටම් -ගම්පොල යුගයේ ගෘහනිර්මාණ චිත්‍ර,මූර්ති හා කැටයම් අදයනය.***

- **ඉගෙනුම් අත්වැල.**

***<u>ඇම්බැක්ක දේවාලයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම.</u>***

- මහනුවර දිස්ත්‍රික්කය ,ගම්පොල යුගය උඩුනුවර මැද පළාත.
- 14 වන ශත වර්ෂය තුන්වන වික්‍රමබාහු රජුගේ අනුග්‍රහය.
- දෙල්මඩ මූලචාරී හා ඔහුගේ ගෝල පිරිස විසින් නිර්මාණ කටයුතු කිරීම.
- කතරගම දෙවියන් උදෙසා නිර්මාණය කිරීම.

***<u>නිර්මාණ සදහා පාදක වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම .</u>***

- ලී කැටයම් ගම්මලු හා පිහිබියා දැවයෙන් කර ඇත.
- අල්ප උන්නත නෙලීමේ ශිල්ප ක්‍රමය.

***<u>ඇම්බැක්ක දේවාලයේ ගෘහනිර්මාණ හා කැටයම් .</u>***

- විශේෂිත වූ පියස්ස පරාල 21 ක් එක් ලී ඇනයකට සම්බන්ද කර ඇත. මෙය මඩොල් කුරුපාව නම් වේ.
- දේවාලයෙහි වාහල්කඩ මණ්ඩපය, දිග් ගෙය ,ගර්භ ගෘහය යන අංග වලින් සමන් විත වේ.
- වාහල්කඩ මණ්ඩපයේ ලී කණු 10 කි සෑම කණුවකම සිව් රැස් පනේල හතර බැගින් පනේල කැටයම් 40 කි .
- දික් ගෙය කණු 32 කි. සෑම කණුවකම සිව් රැස් පනේල හතර බැගින් කැටයම් 128 කි.
- ප්‍රදාන තේමා 5 ක් යටතේ කැටයම් නිර්මාණය කර ඇත.
    1. කල්පිත සත්ව මෝස්තර.-**හේරුන්ද පක්ෂියා/ඇත්කද ලිහිණිය /සැරපෙන්දියා**.
    2. සත්ව මෝස්තර.-**සිංහයා/හංසයා/හංස පුට්ටුව.**
    3. ජන ජීවිතය හා සම්බන්ද කැටයම්.-**රබන් වයන්නා ආශ්වාරෝහක/මල්ලව පොරය.**
    4. වාටි මෝස්තර.(ලීස්තර)-**අරිම්බුව/ගල් බිංදුව/කුන්දිරික්කන්.**
    5. මල් කම් හා ලියකම්-**නෙළුම් මල්/ ලියකම්.**

- **කාර්ය පත්‍රිකාව.- ඇගයීම.**

- ඇම්බැක්ක දේවාලයේ ඉතිහසය කෙටියෙන් පැහැදිලි කරන්න.
    - යුගය / කාලය .
    - අනුග්‍රහය.
    - ශිල්පියා.

- ඇම්බැක්ක දේවාලයේ දැකියා හැකි කල්පිත හා සමකාලින සමාජය නිරූපනය කරන සුවිශේෂී කැටයම් නම් කරන්න.
- වස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සදහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.

    - සම්ප්‍රදාය.
    - වස්තු විද්‍යාත්මක ප්‍රවේශ
    - මාධ්‍ය හා ශිල්ප ක්‍රම.

- ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් පිළිබඳ පහත කරුණු සැලකිල්ලට ගනිමින් කලාත්මක ඇගයීමක් කෙටියෙන් කරන්න.

    - ශිල්ප ක්‍රමය.
    - ශෛලිය.
    - භාව ප්‍රකාශනය.
    - සමකාලින සමාජ නිරූපනය.
    - මාධ්‍ය.